# මුහුණට මුහුණ

**ශ්‍රීනාත් මද්දුමගේ**




## මේ වොයිස් ඔෆ් ලංකා ගුවන් විදුලියයි

# අපි රංජිත් සහ රූබි

*වොයිස් ඔෆ් ලංකා.. කේසී සවුන්ඩ් ඔෆ් ද සවුත් ඊස්ට් 97 පොයින්ට් 7 එෆ් එම්.. සෑම ඉරිදාවකම මේ වේලාවට ගුවන් තරංග ඔස්සේ එබේ නිවසට එන සිංහල සංගීතමය වැඩ සටහනේ නවතම පිටුවක් සමඟ ඔබ හමුවට එන මා රංජිත් වික්‍රමසිංහ ... ගීත රැසක් සමගින් ඔබ සැමගේ උනුසුම් කැදැල්ල වෙත කවදත් පැමිණෙන මා රූබි වික්‍රමසිංහ.. දැන් සූදානම්.....*

*මේ ඔබ සෑම ඉරිදාවකම රාත්‍රී 8 ට ආරම්භ කරන ජනප්‍රිය ගුවන් විදුලි වැඩසටහනේ නිවේදකයන් දෙපළ ඔබ අමතන ආකාරයයි. අපි හිතුවා සන්නස සමඟ කෙටි පිලිසඳරකට මේ දෙපළ එක් කරගන්න..*

**ශ්‍රීනාත්**
*අයාවුබෝවන් රංජිත්.. රූබි...*
**දෙදෙනාම**
*ආයුබෝවන් ශ්‍රීනාත්...*

**ශ්‍රීනාත්**
*දෙන්නම හැම වෙලාවෙම එකටයි ඉන්නෙ නේද..?*
**රංජිත්**
*ඔබ් ශ්‍රීනාත් මේ මගේ හෙවණැල්ල..*

**ශ්‍රීනාත්**
*හෙවණැල්ල නැති වෙලාවක් නැද්ද..?*
**රංජිත්**
*අපොයි තියෙනවා.. (සිනා සේ) නිදාගන්නකොට හෙවණැල්ල අනික් පැත්තෙ...*

**ශ්‍රීනාත්**
*කොච්චර දෙයක්ද.. අහන්නත් සන්තෝසයි.. කියන්නකො ඔය හෙවණැල්ල හමුවුණ හැටි.*
**රංජිත්**
*ඒක දිග කතාවක්..*

**ශ්‍රීනාත්**
*එහෙනම් ඉතින් ගුවන්විදුලි නාට්‍යයක් හැටියට කොටස් වශයෙන් විකාශය කරමු..*
**රංජිත්**
*අන්න මරු වැඩේ.. එහෙනම් පලුවෙනි කොටස.. මං ඉස්කෝලෙගියේ මරදානෙ සෙන්ට් ජෝසප් එකට..*
**රූබි**
*මම ගියේ හෝලි ෆැමිලි කොන්වන්ට් එකට..*

**ශ්‍රීනාත්**
*මට හිතාගත්තහැකි ඊළඟ ටික..*
**රංජිත්**
*ඔයා හිතන්නෙ මං පස්සනේ ගියා කියලද?*
**රූබි**
*එහෙනං ඔයා කියන්නෙ මං පස්සෙන් ආව කියලද?*
**රංජිත්**
*ඇත්තම කියනවා වම් පොඩි ට්‍රයි එකක් දාලා තමයි සෙට් කරගත්තෙ.. මුලින් ගණන් ඉස්සුවා.. පස්සෙ හුලං බැස්සා..*
**රූබි**
*අන්තිමේ ඉස්කෝලෙන් අස්වුණ ගමන් බැන්දා..*
**ශ්‍රීනාත්**
*බැන්ද ගමන් ඔස්ට්‍රේලියාවට ආවා..*
**රංජිත්**
*හරියට හරි.. කොහොමද දන්නේ..?*
**ශ්‍රීනාත්**
*නෑ ඉිත්න්.. අපි පත්තර මිත්‍රයොනෙ... ඕව ගැන ඇහැ ගහගේන ඉන්නෙ.. ඔස්ට්‍රේලායාවට ඇවිත් අවුරුදු ගාණක් වෙනවා නේද?*
**රංජිත්**
*ඔව්.. අවුරුදු 30 ක් විතර වෙනවා..*

**ශ්‍රීනාත්**
*ඉතින් කොහොමද මේ රේඩියෝ කලාවට යොමුවුණේ...?*
**රංජිත්**
*මම ඔස්ට්‍රේලියාවට ඇවිත් සවුන්ඩ් ඉන්ජින-යරින් අවුරුදු 4 ක පාඨමාලාවක් හැදෑරුවා.. ඊට පස්සෙ මෙහෙ තියෙන යම් යම් ගුවන්විදුලි නාලිකා වලට සම්බන්ධ වුණා... 3zzz ගුවන් විදුලියේ හුඟක් වැඩ සටහන් පටිගත කලේ මම.. ඊට පස්සෙ 1985 වසරෙදි සම්පූර්ණ වැඩ සටහනක් කරන්න මට ලැබුණා.. මම වැඩ සටහන් කරන කාලෙදි තමයි පිටස්තර අයට වැඩ සටහනට සහභාගිවෙන්න මැදිරියේ දොර ඇරියේ.. පිටත ඉන්න දක්ෂයන්ට මුලින්ම තැනක් දෙන්න උත්සාහ කලේ මම.. මම ඒ ගැන අවංකව සතුටු වෙනවා..*

**ශ්‍රීනාත්**
*කොච්චර කාලයක් වැඩසටහන කලා ද?*
**රංජිත්**
*මාස ගණනාවක් කළා.. අන්තිමට කට්ටියගෙ සහයෝගය නිසා මම අයින් වුනා.. ඊට පස්සෙ මං මගේම කියලා මේ වජසටහන පටන් ගත්තා..*
**රූබි**
*ශ්‍රීනාත් දැන් අපි අවුරුදු 14 ක් තිස්සෙ මේ වඩ සටහන කරගෙන යනවා.. 15 වන සංවත්සරය උත්සවාකාරයෙන් සමරන්නයි අපි හිතාගෙන ඉන්නෙ...*

**ශ්‍රීනාත්**
*ඇත්තටම ඒක හොඳ ආරංචියක්.. මෙවැනි ජනප්‍රිය වැඩසටහනක් සාර්ථකව අවුරුදු 15ක් කරගෙන යන්න පුලුවන් වුණ රහස මොකක්ද?*
**රංජිත්**
*රහස තමයි ශ්‍රීනාත් හොඳ හිත.. අපිට ආගම්, ජාති, කුල බේධයක් නෑ.. අපිට කවුරුත් එකයි.. ඒ වගේම දේශපාලනය අපේ නාලිකාවෙ නෑ.. අපි හැම තිස්ස-මෙ බන්නේ කාට හරි පුලුවන් විදිහට උදව්වක් කරගෙන විනොදයක් ගෙන දෙන එකයි.. ගතින් මෙහි හිටියත් සිතින් සෑම තත්පරයේම අපේ මව්බිමට අරගෙන යන එක තමයි අපේ අරමුණ..*
**රූබි**
*මේ අපේ ගුවන් කාලය අපි වෙන් කරන්නෙ වැඩ කරලා විවිකීව ඉන්න සති අන්තයේ තවත් ප්‍රශ්න ඔලුවට දෙන්න නෙවෙයි.. සතුටෙන් විනෝදෙන් තියන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නෙ..*
**ශ්‍රීනාත්**
*ඒ බව් ගුවන් විදුලිය අහන හැමෝම කියනවා.. දෙන්නම ගීතත් ගායනා කරනවා නේද?*
**රංජිත්**
*ටික ටික කනවා.. 1991 දී ලංකාවට ගිය වෙලාවෙ ක්ලැරන්ස් විජේවර්ධන මහත්තයයි පද්මසිරි පැස්කුවෙලුයි එකතු වෙලා තමයි අපේ මේ කැසට් එක කළේ.. මෙයට සංගිතය සැපයුවේ සුපර් ෆෝචූන්ස් නායක කීර්ති පැස්කුවෙල්..*

**ශ්‍රීනාත්**
*ඊට පස්සෙ මුකුත් කලේ නැද්ද?*
**රූබි**
*කාර්ය බහුල ත්ත්වයත් එක්ක බැරි වුණා.. ඒත් දැන් නම් පවුලේ ඔක්කොම එකතකු වෙලා සීඩී එකක් කරන්න සැළසුම් කරනවා..*

**ශ්‍රීනාත්**
*කවුද පවුලේ ඔක්කොම..?*
**රංජිත්**
*ඇයි මගේ පුත් දෙන්නා.. ඒ දෙන්නත් හොඳ සංගීත ශිල්පියෝ.. රුක්ෂාන්.. රොමේෂ්.. මේ දෙන්නා දැනටම සංගීත කන්ඩායම් දෙකක වාදන ශිලපියන් හැටියට සහභාගි වෙනවා. අපි ඔක්කොම එකතුවෙලා තමයි සංයුක්ත තැටිය කරන්න බලාපොරගොත්තු වෙන්නෙ..*

**ශ්‍රීනාත්**
*පවුලේ විස්තර ටිකක් කියමුද?*
**රංජිත්**
*මට නංගි ඉන්නවා... අම්මා තාත්තා දෙන්නම නෑ..*
**රූබි**
*නංගිලා දෙන්නයි අයියලා දෙන්නයි ඉන්නවා.. ඒ ගොල්ලො ව්‍යාපාරික කටයුතඳ කරනවා..*

**ශ්‍රීනාත්**
*නුගේගොඩ ඉන්න කවුරුත් ඒ ගැන දන්නවනෙ..*

*මේ අතරතුර රංජිත්තට දුර කථන ඇමතුමක් එයි.. ඔහු මඳක් ඈතට ගොස් කතා කරයි..*

**ශ්‍රීනාත්**
*හදිසි පනිවුඩයක් ද?*
**රංජිත්**
*නෑ ශ්‍රීනාත් ළඟදිම ආටිස්ට්ලා වගයක් ලංකාවෙ ඉදන් ෂෝ එකකට එනවා.. සංවිදායක මන්ඩලය සුලු සාකච්ඡාවක් ගන්න පුලුවන්ද කියලා ඇහුවේ..."*

**ශ්‍රීනාත්**
*ඉගින් මොකද කිව්වේ..?*
**රංජිත්**
*මම කිව්වා ඕනෙ වෙලාවක එක්ක එන්න කියලපා.. මම මුලින්ම කිව්වනෙ අපේ වැඩ සටහනෙන් අපි බලාපොරොත්තු වෙන්නෙ හැමෝටම උදව්වක් කරන්න.*

**ශ්‍රීනාත්**
*කව්ද ක්ෂෙත්‍රයේ උදව් කල අය..?*
**රංජිත්**
*මට උදව් කළේ  මගේ සෙවණැල්ල වගේ ඉන්න සෑබිත් මගො දරුවො දෙන්නත් ඒ වගේම අපි මේ කරන හෝඳ දේ බලා ඉන්න දෙවියන් වහන්සෙත්..*

**ශ්‍රීනාත්**
*මේ කාර්ය බහුල වෙලාවෙ සන්නස වෙනුවෙන් කෙටි කාලයක් ලබාදීම පිළිබඳව අපි නැවත වතාවක් සුතුති වන්ත වෙනවා.. ඒ වගේම අපි ඉතාමත් විනෝදයෙන් මේ කාලය ගත කළා.. සන්නස වෙනුවෙන් අපි ප්‍රාර්ථනා කරනවා ඔබේ ගුවන් විදුලි නාළිකාව සව්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි කියලා..*
**රංජිත්**
*අපේ ගුවන් විදුලිය හැම විටම එබට විවෘතයි.. එන්න අපි සමඟ එකතු වන්න.. ඔබේ ඕනෑඋම ඉල්ලීමක් අප වෙත එවන්න.. ඔබ සියලු දෙනාටම දෙවි පිහිටයි..*

නැවුම් පුවත් හරවත් කතා බහ
ශදස් විශදස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය
ලක් හඬ
FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ

පවන
PAVANA FM
FM 97.4
සිකුරාදා
සවස 6 සිට 8 දක්වා
අන්තර්ජාලයෙන් අසන්නට
www.stereo974.com